**දුම්රිය දෙපාර්තමේන්තුවේ කාලගණක ලිපිකරු සේවයේ 11 ආ ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය(ලිඛිත) - 2023**

2001.11.23 දිනැති රාජ්‍ය පරිපාලන ස්වදේශ කටයුතු පළාත් සභා හා පළාත් පාලන හා දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශ ආයතන අධ්‍යක්ෂ විසින් අනුමත කර ඇති ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ කාලගණක ලිපිකරු සේවයේ බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටියට අනුකූලව කාලගණක ලිපිකරු සේවයේ 11 ආ ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සඳහා අයදුම්පත් කැඳවනු ලබන බව මෙයින් නිවේදනය කරමි. ඒ සඳහා අයදුම්පත මේ සමඟ අමුණා ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව A4 (සෙ.මී.21x29) ප්‍රමාණයේ කඩදාසියේ දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් සකස් කළ යුතුය. නියමිත ආදර්ශ ආකෘතියට අනුකූල නොවන, නිවැරදිව සම්පූර්ණ කර නොමැති, අසම්පූර්ණ තත්ත්වයේ පවතින අයදුම්පත්‍ර කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. නිසි පරිදි අයදුම්පත්‍ර සම්පූර්ණ නොකිරීමෙන් සිදුවන අලාභය අයදුම්කරුවන් විසින් දරාගත යුතුය. අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. ඒ අනුව, සම්පූර්ණ කළ අයදුම්පත උප දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් සහතික කර අදාළ කැබිනට් අංශ මඟින් 2024.02.14 දින හෝ දිනට පෙර දුම්රිය සාමාන්‍යාධිකාරී කාර්යාලයේ පත්වීම් 11 අංශය වෙත ලැබෙන සේ එවිය යුතුය. අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් භාරගැනීමේ අවසාන දිනය 2024.02.14 වැනි දින වේ.

02 මෙම පරීක්ෂණය දුම්රිය සාමාන්‍යාධිකාරී විසින් කොළඹ දී පමණක් පැවැත්වීමට කටයුතු කරනු ලබන අතර, සියළුම අයදුම්කරුවන් දුම්රිය සාමාන්‍යාධිකාරී විසින් පවරනු ලබන නීතිරීති වලට යටත් විය යුතුය. එම නීතිරීති උල්ලංඝණය කළහොත් දුම්රිය සාමාන්‍යාධිකාරී විසින් පවරනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට සිදු වනු ඇත.

03 අයදුම් කිරීම සඳහා සුදුසුකම් - අයදුම්පත් භාරගන්නා අවසාන දිනය වන විට කාලගණක ලිපිකරු සේවයේ 11 ආ ශ්‍රේණියේ නිලධාරීන් මෙම විභාගය සඳහා ඉදිරිපත් වීමට සුදුසුකම් ලබයි.

04 සෑම අයදුම්කරුවෙකුම කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයේදී තම අනන්‍යතාවය ඔප්පු කර සිටිය යුතුය. මේ සඳහා පහත දැක්වෙන කවර ලියවිල්ලක් හෝ භාර ගනු ලැබේ.

i. ජාතික හැඳුනුම්පත
ii. වලංගු විදේශ ගමන් බලපත්‍රය
iii. වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය

05 අයදුම්පත්‍රය පිරවීමේදී ඉතා සැලකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතුය. අයදුම්කරුවෙකු විසින් සපයා ඇති තොරතුරුවල කිසියම් අසත්‍ය භාවයක් අනාවරණය වුවහොත් අයදුම්කරු හා අයදුම්පත්‍රය සහතික කරනු ලබන නිලධාරියා ඒ සම්බන්ධයෙන් වගකිව යුතුය.

06 අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමුකොට ඇති අයදුම්කරුවන් වෙත දුම්රිය සාමාන්‍යාධිකාරී විසින් ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. විභාගය සඳහා පෙනී සිටින දිනයේ විභාග ශාලාධිපති වෙත තම අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කළ යුතුය.

07 දුම්රිය සාමාන්‍යාධිකාරී විසින් නිකුත් කරන ලද ප්‍රවේශ පත්‍ර ඇති නිලධාරීන්ට විභාගයට පෙනී සිටීමට හැකි වන පරිදි උපදෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් රාජකාරී නිවාඩු ලබා දිය යුතුය. ගමන් ගාස්තු ගෙවනු නොලැබේ.

08 මෙම පරීක්ෂණය සිංහල සහ දෙමළ මාධ්‍යයෙන් පමණක් පවත්වනු ලැබේ. අයදුම්පත් යොමු කළ පසු කිසිදු හේතුවක් නිසාවත් පරීක්ෂණය සඳහා ඉල්ලුම් කළ භාෂා මාධ්‍යය වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.

CamScanner

09 සමාර්ථය සඳහා අවම වශයෙන් සියයට හතළිහක(40%) ලකුණු ප්‍රතිශතයක් ලබාගත යුතු වේ.

10 විභාග පටිපාටිය - අයදුම්කරුවන් පහත දැක්වෙන විෂයන්ගෙන් යුත් ලිඛිත පරීක්ෂණයට පෙනී සිටිය යුතුය.

| විෂය | ලකුණු | කාලය | විෂය අංකය | සමත් ලකුණු |
|---|---|---|---|---|
| කාර්යාල කාර්ය පරිපාටි පිළිබඳ දැනුම | 100යි | පැය 1 ½යි | 01 | 40 |

10.1 විෂය නිර්දේශය :-

ප්‍රශ්න පත්‍රය මනම පිළිතුරු සැපයිය යුතු බහුවරණ මාදිලියේ ප්‍රශ්න පත්‍රයකි. කර්මාන්ත ශාලා හා ක්ෂේත්‍රයේ කණිෂ්ඨ සේවක හා යටත් නිලධාරීන්ගේ නිවාඩු හිමිකම, රාජකාරි වේලාවන්, බැහැර සේවය, අතිකාල දීමනා, නිදහස් දුම්රිය ගමන් බලපත්‍ර අයිතිය හා නිකුත් කිරීම, නිවාඩු ලේඛණ පවත්වාගෙන යාම, අනවසර නොපැමිණීම, වට්ටෝරු බඩු, කාර්යාලීය ලේඛණ, දුම්රිය දෙපාර්තමේන්තුවේ එක් එක් උප දෙපාර්තමේන්තුවල කාර්ය භාරයන්

11 මෙම විභාගයට අදාළ විභාග ප්‍රතිඵල දුම්රිය සාමාන්‍යාධිකාරි විසින් නිකුත් කරනු ලැබේ.

12 මෙම විභාග නිවේදනයට විධිවිධාන සලසා නොමැති කවර කරුණක් වුව ද, දුම්රිය සාමාන්‍යාධිකාරීගේ තීරණය අවසන් තීරණය වන්නේය.

13 සිංහල හා දෙමළ මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් හෝ නොගැලපීමක් හෝ අනනුකූලතාවයක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක ස්ංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

එච්.එම්.කේ.ඩබ්ලිව්. බණ්ඩාර
දුම්රිය සාමාන්‍යාධිකාරි

2024.01.19 වැනි දින,
තැ.පෙ.355,
කොළඹ 10,
දුම්රිය සාමාන්‍යාධිකාරි කාර්යාලයේදී.

CS CamScanner